# වැහි කුමාරි



ඔෂිකා ටෙෂුලී ජයසේකර

කෘතියේ නම - වැහි කුමාරි

ප්‍රථම මුද්‍රණය - 2025.01.15

කතාව සහා චිත්‍ර - ඔෂිකා ටෙෂුලී ජයසේකර

කතෘගේ ලිපිනය - අංක.410/ඒ,නාරංගොඩ,හැදෙණිය

පාසල - මහාමායා බාලිකා විද්‍යාලය

ශ්‍රේණිය - 2 B

පරිගණක අක්ෂර හා - මගේ ආදරණීය මව

පිටු සැකැසුම

ISBN - 978624208663 -7



නැණ පහන් දල්වා දිවි මගේ  සරු කරන

මගේ මහාමායා බාලිකා මැණියන්ට

පුදන්නෙමි පොත් පිංච ආදර බැතින් ..........



# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි.ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධමත් කාලපරිච්ඡේද නිසාය.එසේ නම් මහාමායා ඉතිහාසයේද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි.දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රනථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි.පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවට ආදී කතෘ කරදන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සාම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමු කරන "හෙරණගත්කරණී "ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක්ද වෙයි.ජීවිතේ මුල් අවධියේම තම සහජ කුසලතාවය හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය-මහනුවර

පවනි ඉතා හොද කරුණාවන්ත ළමයෙකි.හැමෝම එයාට ආදරෙයි.



පවනි ගස්,මල්,සතුන්ට හා මිනිසුන්ට ආදරෙයි.හොඳින් බලා ගත්තේ හරිම සතුටින්.



කාලයක් යනකොට ගමට වැස්ස නැති වුණා .



පවනිට ගොඩක් දුක හිතුණා.



පවනි තාත්තාට මෙහෙම කිවුවා.තාත්තේ මට මායා දුන්නක් ඕනේ.



තාත්තා පාළු කුඹුරට ගිහින් තනිවම අඬමින් කල්පනා කළා.



තාත්තා අඬනවා සුරංගනාවියක් දැක්කා. සුරංගනාවිය තාත්තාට මායා දුන්නක් දීලා ගියා.



තාත්තා පවනිට මායා දුන්න දුන්නා.පවනිට ගොඩක් සතුටු හිතුණා.



පවනි මායා දුන්න අතට අරං අහසට විද්දා.එක පාරටම කළු වලාකුළු ඇවිත් වහින්න පටන් ගත්තා.



නියගය  ඉවර වුණාට පස්සේ ආයමත් ගස්වැල් කොළ පාටට හැදුණා.පවනිගේ කරුණාවන්ත හිත නිසා  ඇයට හැමෝම  ආදරේ කළා.





ඔෂිකා ටෙෂුලි ජයසේකර

2 ශ්‍රේණිය B

මහාමායා බාලිකා විද්‍යාලය

මහනුවර

## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහා එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැටදහසකට වැඩි ප්‍රමාණයක් දේශිය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයයි.එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමකි.පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප,පළාත්,ජාතික හා ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙරට ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනිම විශේෂත්වයකි.මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය,දියණියන් ,ගුරුභවතුන් ,දෙමාපියන්,ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි.පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය.මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුල විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි.මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි.තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ.එම නිසඟ සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක

සෙනෙවිරත්න මහසේකම්